# පරිච්ඡේද 09

## සමාජ සජීව කාරක

### 9.0 ක්‍රියාත්මක කිරීමේ කාල සටහන

මෙම පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක කිරීමේ කාල සටහනේ (රූප 9-12 ) තැනිම් ක්‍රියාවලියේ භෞතික ප්‍රගතියට අනොන්‍යව ප්‍රතිස්ථාපන වැඩසටහන යාකර ඇත. ඉතා සියුම් මට්ටමේදි විශාල සිවිල් සහ ප්‍රතිස්ථාපන ක්‍රියාවලියන් පියවරෙන් පියවරට එකිනෙකට සම්බන්ධ කර ඇත.

### 9.1 මහා පරිමාණ මට්ටමේ සම්බන්ධීකරණ

සිවිල් තැනිම් ක්‍රියාවලිය සඳහා මහා පරිමාණ කාල සටහන රූප 9, 1 හා 2 ඒ.ඩී.බී. හා ජෙබික් කොටසේ පිළිවෙලින්) පෙන්වා ඇත. රූප 9, 1 හා 2 හි ඉඩම් අත්පත් කර ගැනිම් හා ප්‍රතිස්ථාපන ක්‍රියාත්මක කිරීමේ වැඩ සටහන් ක්‍රියාවලිය දක්වා ඇත. එය දළ වශයෙන් කොටස් හතරකට වර්ගීකරණය කර ඇත.

1. වන්දි ගෙවීම
2. ප්‍රතිස්ථාපනය/නැවත පදිංචි කිරිම
3. ආදායම් පුනරුත්ථාපනය
4. පසු ප්‍රතිස්ථාපන අවධියේදි සමාලෝචන,ඇගයීම හා බලපෑම් තක්සේරු කිරීම. ගාලු වරාය ප්‍රවේශ මාර්ගය හා ඒ 4 සහ බි 5 ප්‍රවේශ මාර්ගද ඉහත සඳහන් ක්‍රියාවලිය යටතට ගෙනෙනු ඇත.

### 1. සිවිල් වැඩ

රූප 9,2 ඇති ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීමේ කාලසටහන අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජෙබික් අංශයේ කොන්ත්‍රාත් කොටස් දෙකෙහිම ඉඩම් අත්පත් කර ගැනිම වර්ෂ 2002 ජනවාරි මස අවසන් කිරිමට බලාපොරොත්තු වේ.

**පහත සඳහන් සිවිල් වැඩ කාලසටහන අනුව සිදුවේ.**

1. අධීක්ෂණ උපදේශකයින්ගේ ප්‍රදානය 2001. සැප්තැම්බර් මස
2. සිවිල් කොනත්‍රාත් කරුවන් පෙර සුදුසුකම් කිරිම 2001 සැප්. මස
3. කොන්ත්‍රාත් කරුවන් තෝරා ගැනිම 2002 මාර්තු
4. තැනිම් කටයුතු ආරම්භය 2002 අප්‍රියල් / මැයි

පටන් ගත් දිනයේ සිට තැනිම් කටයුතු අවසන් කිරිමට ගත වන කාලය මාස 52 කි.

එමෙන්ම ඒඩිබි කොටසේ ඇස්තමේන්තු කරන ලද ක්‍රියාත්මක කිරීමේ කාල වකවානුව රූප 9 - 1 හි පෙන්වා ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉඩම් අත්පත් කර ගැනිමේ මුල් පියවර 2001 ඔක්තෝම්බර් මස වන විට අවසාන කිරිමට බලාපොරොත්තු වේ.
**පහත සඳහන් සිවිල් වැඩ කාලසටහන අනුව සිදුවේ.**

පහත සඳහන් සිවිල් වැඩ කාලසටහන අනුව සිදුවේ.

1. අධීක්ෂණ උපදේශකයින්ගේ ප්‍රදානය 2001. ජූලි මස වනවිට

2. සිවිල් කොන්ත්‍රාත් කරුවන් පෙර සුදුසුකම් කිරීම 2001 අප්‍රියල් මස

3. කොන්ත්‍රාත් කරුවන් තෝරා ගැනීම 2001 නොවැම්බර්

4. තැනීම් කටයුතු අවසාන කිරීම පටන් ගත් දින සිට මාස 52 ට පසු

පටන් ගත් දිනයේ සිට තැනීම් කටයුතු අවසන් කිරීමට ගත වන කාලය මාස 52 කි.

## 2) ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය

ඇස්තමේන්තු කරන ලද ක්‍රියාත්මක කිරීමේ කාල සටහනට අනුව ඒ.ඩී.බී කොටසේ තැනීම් කටයුතු පලමු අදියර 2001 දෙසැම්බර් මස පටන් ගත හොත් ප්‍රතිස්ථාපන වැඩ සටහනේ පහත සඳහන් ක්‍රියාවලියන් එයට පෙර පටන් ගනු ඇත.

i බලපෑමට ලක් වූ අය හඳුනා ගැනීම හැඳුනුම් පත් නිකුත් කිරීම හා පුද්ගලික දිමනා ලිපි ගොනු සකස් කිරීම

ii ව්‍යාපෘති ප්‍රදේශ වල ප්‍රචාරක කටයුතු පටන් ගැනීම.

Iiii ප්‍රතිස්ථාපන ස්ථාන තෝරා ගැනීම සහ නැවත පදිංචි වීමේ දිමනා ගෙවීම (මාරු වීමේ සහ නිවාස තැනීමේ දිමනා ) ඉවත් කිරීමට අපේක්ෂිත අය සඳහා මෙම ක්‍රියාවන්ගෙන් පසු කෘෂි කාර්මික ඉඩම් සඳහා වන්දි ගෙවීම නැවත ලබා දීම සඳහා මිලදී ගන්නා කෘෂි කාර්මික ඉඩම් සහ අවසාන වශයෙන් ආපදාවන්ට ලක්වූ අයගේ ආර්ථිකය නංවා ලීම කෙරෙනු ඇත.

## 9.3 අනෙක් අංශ සඳහා ප්‍රතිස්ථාපන ක්‍රියාවලියන්

මුල් පියවරේ බලපෑමට ලක් වූ අය නැවත පදිංචි කිරීම සඳහා යොදා ගත් ආයතනික සංවිධානය ( සේවා භාණ්ඩ හා අනෙක් ආධාර ) ඉතා වැදගත් සේ සලකා, ජෙබික් කොටස් දෙකෙහි සහ ඒඩීබී කොටසේ 2 වන අදියරේ ප්‍රතිස්ථාපන වැඩසටහන සඳහා යොදා ගනු ඇත.

# රූප 9.1 ADB කොටසේ සිවිල් කාර්යන්ට සම්බන්ධ ප්‍රතිස්ථාපන කටයුතු

| සිවිල් කාර්යන් | 2000 | | | | 2001 | | | | 2002 | | | | 2003 | | | | 2004 | | | | 2005 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1-3 | 4-6 | 7-9 | 10-12 | 1-3 | 4-6 | 7-9 | 10-12 | 1-3 | 4-6 | 7-9 | 10-12 | 1-3 | 4-6 | 7-9 | 10-12 | 1-3 | 4-6 | 7-9 | 10-12 | 1-3 | 4-6 | 7-9 | 10-12 |
| පලමු 50% ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු (කි.මී.1+500 සිට 21+500 සහ 48+400 සිට 61+050) දක්වා කොන්ත්‍රාත් කරුට බාරදීම | | | | | | | | | | | | ■ 2002 නොවැම්බර්. 30 | | | | | | | | | | | | |
| ඉතිරි 50% , ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සහ කොන්ත්‍රාත් කරුට බාරදීම | | | | | | | | | | | | | ■ 2002 පෙබරවාරි. 30 | | | | | | | | | | | |
| පරීක්ෂණ උපදේශකයින් පත් කිරීම | | | | | | | | | | | | ■ 2002 නොවැම්බර් | | | | | | | | | | | | |
| කොන්ත්‍රාත් කරු තෝරා ගැනීම | | | | | | | | | | | | ■ 2002 නොවැම්බර් | | | | | | | | | | | | |
| සිවිල් කාර්යන් ආරම්භ කිරීම | | | | | | | | | | | | ■ 2002 දෙසැම්බර් | | | | | | | | | | | | |
| තැනීම් කාලය | | | | | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |
| **ප්‍රතිස්ථාපන කාර්යන්** | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ප්‍රතිස්ථාපන ඒකක ශක්තිමත් කිරීම | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| සමාලෝචන ආයතන පත් කිරීම | | | | | | ■ | | | | | | | | | | | | | | | | | | |
| ප්‍රචාරක වැඩසටහන | | | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | |
| වන්දි ගෙවීම | | | | ■ | ■ | ■ | | | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| කළමණාකරන තොරතුරු පද්ධතිය | | | | | | | ■ | | | | | | | | | | | | | | | | | |
| අවතැන් වූ අය හදුනා ගැනීම | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| හැදුනුම්පත් නිකුත් කිරීම / අ.අයගේ ලිපිගොණු | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | | |
| ලාරක්/ ප්‍ර.උ.ක. / අස්වැසුම් කමිටු ක්‍රියාත්මක කිරීම | | | | | | | | | ■ | ■ | ■ | | | | | | | | | | | | | |
| ප්‍රතිස්ථාපන වැඩබිම් තෝරා ගැනීම | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | | |
| ප්‍රතිස්ථාපන වැඩබිම් සඳහා යටිතල පහසුකම් ඇති කිරීම | | | | | | ■ | ■ | ■ | | ■ | ■ | ■ | | | | | | | | | | | | |
| ප්‍රතිස්ථාපන ස්ථාන වල පදිංචි කිරීම | | | | | | | ■ | ■ | | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | |
| අවතැන් වුවන්ට නිවාස තැනීම | | | | | | ■ | ■ | ■ | | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | |
| අස්වැසුම | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | |
| පුනරුත්ථාපනය | | | | | | | | | | | | → | → | → | | → | → | → | → | → | → | → | → | → |
| සමාලෝචනය | | | | | | | ■ | | | | ■ | | | ■ | | | ■ | | ■ | ■ | | | ■ | |
| ඇගයීම | | | | | | | | | | | | | | | ■ | | | | ■ | | ■ | | | ■ |

# රූප 9.2 JBIC කොටසේ (පැකේජ 1 හා 2) සිවිල් කාර්යන්ට සම්බන්ධ ප්‍රතිස්ථාපන කටයුතු

